**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**

**காணாமல்போனஆட்கள்பற்றியஅலுவலகம்**

**OFFICE ON MISSING PERSONS**

# ඇබෑර්තු

- අතුරුහදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කාර්තව්‍ය ඉටුකිරීම) පනත මඟින් පිහිටුවන ලද ආයතනයකි.
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මුදල් හා ප්‍රසම්පාදන අංශ ප්‍රධානී (තනතුරු 01 ) HM1-1

**ආකියාවේ ස්වභාවය:** මුදල් හා ප්‍රසම්පාදන අංශයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම මෙන්ම, අදාළ මුදල් හා ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පද්ධතීන් සංවර්ධනය කිරීම සහ සියලුම මුදල් හා ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**සුදුසුකම් :** (පහත 1 හෝ 2 අනුව)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ / කළමනාකරණය (මූල්‍ය) යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරට අදාළ වෙනත් උපාධියක් **සහිතව** අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 13 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 13 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**වයස :**අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**HM 1-1 (රු. 140,640 – 15x 4,100 – 202,140/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ප්‍රධානී (තනතුරු01) HM 1-1

**ආකියාවේ ස්වභාවය:** නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම්වලට අදාළ නීතිමය කාර්යභාර සම්බන්ධ කටයුතුවලදී සහාය වීම. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිමය, ප්‍රතිපත්තිමය සහ පර්යේෂණමය මැදිහත්වීම් සිදු කිරීම සඳහා නීතිමය අභියෝගවලට විසඳුම් සෙවීම සහ කරුණු වෙනුවෙන් උපදෙස් දීමේ උපායමාර්ග සැකසීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් හෝ නීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලබා තිබීම **සමඟ** නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත

මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 12 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**HM 1-1 (රු. 140,640 – 15x 4,100 – 202,140/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## සන්නිවේදන සහ ක්ෂේත්‍ර ප්‍රධානී (තනතුරු01) HM 1-1

**රැකියාවේ ස්වභාවය:**සන්නිවේදන සහ ක්ෂේත්‍ර ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍ය ඔස්සේ සන්නිවේදන උපාය මාර්ග සකස් කිරීම සහ සංවර්ධනය කිරීම. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලුම ව්‍යාපෘති ප්‍රවේශ සහ සන්නිවේදන කටයුතු සඳහා නායකත්වය ලබා දීම.

**සුදුසුකම්:**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සන්නිවේදනය හෝ ජන මාධ්‍ය පිළිබඳ උපාධියක් **සමඟ** අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම. තවද, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ මට්ටමේ' අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද.

**වයස:**අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ ස්ථිර තනතුරුවල දැනටමත් නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප:**HM 1-1 (රු. 140,640 – 15x 4,100 – 202,140/-)(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## රැකවරණ ප්‍රධානී (තනතුරු01) HM 1-1

**රැකියාවේ ස්වභාවය:** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රාදේශීය කාර්යාලවල රැකවරණ ඒකක අධීක්ෂණය කිරීමේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන විධිමත් ක්‍රියා පටිපාටි සහ ප්‍රායෝගික ක්‍රමවේදයන් ඇතුළුව, ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන වගකීම වේ.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් **නීතිය / සාමය සහ ගැටුම් නිරාකරණය / දේශපාලන විද්‍යාව හෝ සමාජ විද්‍යාව** පිළිබඳ උපාධියක් ලබා තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයකින් හෝ **මානව හිමිකම්** පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. තවද, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක'කළමනාකරණ මට්ටමේ'අවම වශයෙන් වසර 12ක පළපුරුද්දක් තිබීම.

**වයස:**අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ ස්ථිර තනතුරුවල දැනටමත් නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**HM 1-1 (රු. 140,640 – 15x 4,100 – 202,140/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## නීති නිලධාරී (තනතුරු04) MM 1-1

**රැකියාවේ ස්වභාවය:** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ, ඒකක ප්‍රධානියා සමඟ සම්බන්ධීකරණයෙන් නීතිමය මැදිහත්වීම් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ උපායමාර්ගික නීතිමය ප්‍රතිචාර සංවර්ධනය කිරීම ඇතුළුව නීතිමය රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. පනතේ අදාළ විධිවිධාන යටතේ අධිකරණය ඉදිරියේ කාර්යාලය නියෝජනය කිරීම සහ ඵලදායී නඩු කළමනාකරණය සහ යාවත්කාලීන කරන ලද නීතිමය ලියකියවිලි සහතික කිරීම සඳහා බාහිර උපදේශකයින් සමඟ සම්බන්ධීකරණය කිරීම. අධිකරණ ක්‍රියාවලීන් සඳහා නීතිමය ලේඛන සකස් කිරීමට සහාය වීම සහ අදාළ නීති සහ ප්‍රමිතීන් සමඟ අභ්‍යන්තර ක්‍රියා පටිපාටි අනුකූල වීම සහතික කිරීම.අවශ්‍ය සාක්ෂි ඇති විට නීතිමය ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම සඳහා පවුල් සහාය සහ සෙවීම් ඒකක ඇතුළු අදාළ ඒකක සමඟ සම්බන්ධ වී, නිසි නීතිමය පසු විපරමක් සහ නඩු පවරන බලධාරීන් වෙත යොමු කිරීම් සහතික කිරීමට සහාය වී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද වෙනත් නීතිමය සහ පරිපාලන රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම් :** ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්දක් සහිත වීම.

**වයස :** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**MM1-1 2025 (91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

## මණ්ඩල ලේකම් (තනතුරු 01) MM 1-1

**රැකියාවේ ස්වභාවය:** රැස්වීම් සංවිධානය කිරීම, න්‍යාය පත්‍ර සකස් කිරීම, ලේඛන බෙදා හැරීම සහ ව්‍යවස්ථාපිත හා සංවිධානාත්මක අවශ්‍යතාවලට අනුකූලව නිවැරදි රැස්වීම් සහ නිල වාර්තා පවත්වා ගැනීම මඟින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලමණ්ඩලයට පූර්ණ ලේකම් සහ පරිපාලන සහායක් ලබා දීම. අදාළ අංශ හරහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ කාලෝචිත ලෙස සන්නිවේදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා, ලිපි හුවමාරු සහ රහස්‍ය ලේඛන සුරක්ෂිතව භාරකාරත්වය පවත්වා ගැනීම. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත සහ අදාළ පාලන ක්‍රියා පටිපාටි සමඟ සම්බන්ධීකරණය සහ අනුකූලතාවය සහතික කරමින්, මණ්ඩලය, සභාපති, අභ්‍යන්තර ඒකක සහ බාහිර පාර්ශ්වකරුවන් අතර ප්‍රාථමික සම්බන්ධීකාරක ලෙස ක්‍රියා කිරීම. දැඩි රහස්‍යභාවය ආරක්ෂා කර, ක්‍රියා පටිපාටික කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම මඟින් යහ පාලනයට සහාය වීම, වාර්තා කිරීමේ අවශ්‍යතා සඳහා සහාය වීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද ඕනෑම අමතර රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම් :**

1. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, නීතිය/නීති අධ්‍යයනය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් ඕනෑම උපාධියක්.

**හෝ**

2. සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ලේකම් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ඇතිව, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

**හෝ**

3. සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක (01) සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්දක් ඇති වරලත් ආයතනික ලේකම්වරයකු වීම.

**වයස:**අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය .

**වැටුප් පරිමාණය:**MM1-1 2025 (රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## ජ්‍යෙෂ්ඨ රැකවරණ නිලධාරී(තනතුරු01) MM 1-1

**රැකියාවේ ස්වභාවය:** තර්ජන පිළිබඳ පැමිණිලි ලැබීම, වාර්තා කිරීම, විමර්ශනය කිරීම සහ සත්‍යාපනය කිරීම ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ආරක්ෂාව සම්බන්ධ කාර්යයන් ඉටු කිරීමේදී ඒකක ප්‍රධානියාට සහාය වීම. සුදුසු ආරක්ෂක පියවරයන් සහ පසු විපරම් ක්‍රියාමාර්ග මඟින් වින්දිතයින්, සාක්ෂිකරුවන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කාර්ය මණ්ඩලය සහ අනෙකුත් අදාළ පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ ප්‍රවේසම සහතික කිරීම. ඵලදායී නඩු කළමනාකරණය සහ ආරක්ෂණ ප්‍රතිචාර සඳහා සහාය වීම සඳහා වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය සහ සෙවීම් ඒකකය සමඟ සමීපව සම්බන්ධීකරණය කිරීම. ආරක්ෂණ කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද ඕනෑම අමතර රාජකාරියක් භාර ගැනීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ වන, මානව හිමිකම්/ නීතිය/ සමාජීය විද්‍යාව/ මනෝවිද්‍යාව/ උපදේශනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සාමය සහ ගැටුම් නිරාකරණය/ දේශපාලන විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක්.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක පළපුරුද්ද.

**වයස:**අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**MM1-1 2025 (රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී (තනතුරු02) MM 1-1

**රැකියාවේ ස්වභාවය:**

අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් විමර්ශන, පරීක්ෂණ සහ සෙවීම් කටයුතු පැවැත්වීම සඳහා වගකිව යුතුය. විමර්ශන ලිපිගොනු නිතිපතා සමාලෝචනය කර නිසි ලෙස නඩත්තු කරන බවටත්, අදාළ නීති නිලධාරීන්ට සහ සහායක ඒකකවලට විමර්ශන ප්‍රගතිය සහ තත්ත්ව යාවත්කාලීන කිරීම් පිළිබඳව කඩිනමින් දැනුම් දෙන බවටත් සහතික විය යුතුය. ඵලදායී නඩු කළමනාකරණය සහ තොරතුරු හුවමාරුව සහතික කිරීම සඳහා ප්‍රාදේශීය විමර්ශන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ස්ථාපිත සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිසහ ප්‍රමිතීන්ට අනුකූලව සියලුම විමර්ශන කටයුතු සිදු කරන බවට සහතික වීම. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද වෙනත් රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, නීතිය/ මානව විද්‍යාව/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජීය විද්‍යාව/ සාමය සහ ගැටුම් නිරාකරණය/ දේශපාලන විද්‍යාව හෝ තනතුර සඳහා අදාළ වන විෂය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක්.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක පළපුරුද්ද.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**MM1-1 2025 (රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## කැනීම් සහ මෘත දේහගොඩගැනීමේ නිලධාරී (තනතුරු 02 ) MM 1-1

**රැකියාවේ ස්වභාවය:** ජාතික නීති සහ ජාත්‍යන්තර අධිකරණ වෛද්‍ය ප්‍රමිතීන්ට අනුකූලව අතුරුදහන් වූ තැනැත්තන්ගේ නඩු වලට අදාළ සැක සහිත වල දැමූ ස්ථානවල කැණීම් සහ ගොඩගැනීමේ මෙහෙයුම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම. නිසි ප්‍රතිසාධනය, ලියකියවිලි, සංරක්ෂණය සහ සාක්ෂි භාරකාර දාමය සහතික කිරීම සඳහා ස්ථාන තක්සේරු කිරීම් සිදු කිරීම සහ අදාළ විශේෂඥයින් සහ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම. අවශ්‍ය විටෙක නීතිමය කටයුතු සඳහා තාක්ෂණික වාර්තා සකස් කිරීම සහ විශේෂඥ සහය ලබා දීම. සියලුම වැඩ කටයුතු ආරක්ෂිතව, ගෞරවනීයව සහ මානව ගරුත්වයට සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන බවට සහතික වීම. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද අනෙකුත් රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පුරාවිද්‍යාව, මානව විද්‍යාව (භෞතික හෝ අධිකරණ වෛද්‍ය මානව විද්‍යාව පිළිබඳ විශේෂීකරණයක් සහිතව) හෝ භූ විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින්ලබාගත් උපාධියක්.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක පළපුරුද්ද.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** MM1-1 2025 (රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක (තනතුරු 01 ) MM 1-1

**රැකියාවේ ස්වභාවය:** දත්තවල ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා දත්ත රැස් කිරීමේ සහ විශ්ලේෂණ පද්ධති සැලසුම් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂකයෙකු වගකිව යුතුය. විවිධ ප්‍රභවයන්ගෙන් දත්ත රැස් කිරීම සහ කළමනාකරණය කිරීම, දත්ත ආශ්‍රිත ගැටළු හඳුනා ගැනීම සහ විසඳීම, අන්තර්දෘෂ්ටිය ජනනය කිරීම සඳහා තොරතුරු විශ්ලේෂණය කිරීම සහ සොයාගැනීම් මත පදනම්ව නිර්දේශ සැපයීම මෙම භූමිකාවට ඇතුළත් වේ. ආයතනික තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා කළමනාකරණය සමඟ සමීපව කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ නායකත්වය විසින් පවරන ලද අතිරේක කාර්යයන් ඉටු කරන අතරම, තීරණ ගැනීමට සහාය වීම සඳහා විශ්ලේෂක සංඛ්‍යානමය විශ්ලේෂණ, වාර්තා, ප්‍රස්ථාර සහ ඉදිරිපත් කිරීම් ද සකස් කරයි.

**සුදුසුකම්:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ ගණිතය/ සංඛ්‍යානය උපාධියක්.

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක

   පළපුරුද්ද

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු තොරතුරු හා සන්නිවේදනක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
   **සහ**
   රාජ්‍ය සේවය, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්/ආයතනයක් හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** MM1-1 2025 (රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## අන්තර්ජාල සහ සමාජ මාධ්‍ය නිලධාරී (තනතුරු01) JM 1-1

**රැකියාවේ ස්වභාවය:** ආයතනික ප්‍රතිපත්ති සහ රාජ්‍ය අංශයේ ප්‍රමිතීන්ට අනුකූලව නිවැරදි, කාලෝචිත සහ අනුමත තොරතුරු ප්‍රකාශයට පත් කිරීමෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිල වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය වේදිකා කළමනාකරණය කර යාවත්කාලීන කිරීම. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි විධි නියෝග සහ ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා සටහන්, තොරතුරු ග්‍රැෆික්ස් සහ වීඩියෝ වැනි ඩිජිටල් අන්තර්ගතයන් සංවර්ධනය කර බෙදා ගැනීම. ඩිජිටල් සම්බන්ධතාවය නිරීක්ෂණය කිරීම, කාර්ය සාධන වාර්තා සකස් කිරීම සහ සන්නිවේදන උපාය මාර්ග වැඩිදියුණු කිරීම නිර්දේශ කිරීම. විශේෂයෙන් සංවේදී අවස්ථා සම්බන්ධයෙන්, සියලුම මාර්ගගත සන්නිවේදනයන් නීතිමය, සදාචාරාත්මක සහ රහස්‍යතා අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික වීම.එළඳායී, ගෞරවනීය සහ වින්දිතයින් කේන්ද්‍ර

කරගත් මහජන සන්නිවේදනයට සහාය වීම සහ කළමනාකරණය විසින් පවරන ලද අනෙකුත් රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම්:** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, අන්තර්ජාල සංවර්ධනය, ජනසන්නිවේදනය හෝ මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** JM1-1 2025 (රු. 72,650 – 10x–1,360 – 18x 2,040 – 122,970/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## විමර්ශන පර්යේෂණ නිලධාරී (තනතුරු 01 ) JM 1-1

**රැකියාවේ ස්වභාවය:** අනුමත සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට අනුකූලව පවරා ඇති නඩු සම්බන්ධයෙන් අපක්ෂපාතී සහ ක්‍රමානුකූල පරීක්ෂණ සිදු කිරීම, සාක්ෂි සහ ලේඛනගත සාක්ෂි එකතු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. වින්දිතයින්ට සංවේදී සහ සදාචාරාත්මක සහභාගීත්වය සහතික කරමින් සාක්ෂිකරුවන්, බලපෑමට ලක් වූ පවුල් සහ අනෙකුත් අදාළ පුද්ගලයින් හඳුනා ගැනීම, සොයා ගැනීම සහ සම්මුඛ සාකච්ඡා කිරීම. අවශ්‍ය විටෙක අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය ඇතුළුව ක්ෂේත්‍ර විමර්ශන සහ අදාළ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම. දැඩි රහස්‍යභාවය පවත්වා ගැනීම සහ සියලු කටයුතුවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලපනත, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ මානව හිමිකම් මූලධර්මවලට අනුකූල වීම. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට නිතිපතා ප්‍රගති වාර්තා සැපයීම සහ අදාළ ඒකකවලට සහාය වීම සහ කළමනාකරණය විසින් පවරන ලද වෙනත් රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය/ අපරාධ විද්‍යාව/ සමාජ විද්‍යාව/ මානව විද්‍යාව/ ඉතිහාසය/ දේශපාලන විද්‍යාව හෝ තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**JM1-1 2025 (රු. 72,650 – 10x–1,360 – 18x 2,040 – 122,970/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## විමර්ශන නිලධාරී (තනතුරු 04 ) JM 1-1

**රැකියාවේ ස්වභාවය:** පවරා ඇති නඩු වලට අනුකූලව අතුරුදහන් වූ සහ අතුරුදහන් කල පුද්ගලයින් සම්බන්ධයෙන් විමර්ශන, පරීක්ෂණ සහ සෙවීම් සිදු කිරීම. සම්පූර්ණ සහ යාවත්කාලීන නඩු ගොනු පවත්වාගෙන යාම සහ විමර්ශන ක්‍රියාවලිය පුරාවට නිවැරදි ලියකියවිලි සහ වාර්තා කිරීම සහතික කිරීම. අවශ්‍ය තොරතුරු සහ වාර්තා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, සන්නද්ධ හමුදා, රෝහල් සහ රජයේ ලේඛනාගාර වැනි අදාළ ආයතන සමඟ සම්බන්ධ වීම. නඩු දත්ත සහ පැමිණිලි ගොනු නිසි ලෙස නඩත්තු කිරීම සහතික කරමින් කාලෝචිත හා නිවැරදි විමර්ශන වාර්තා සකස් කිරීම. විමර්ශන ලියකියවිලි සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ සම්පාදනය කිරීම සඳහා සහාය වීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පවරන ලද වෙනත් රාජකාරි ඉටු කිරීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය/ අපරාධ විද්‍යාව/ සමාජ විද්‍යාව/ මානව විද්‍යාව/ ඉතිහාසය/ සමාජ විද්‍යාව/ සාමය සහ ගැටුම් නිරාකරණය/ දේශපාලන විද්‍යාව හෝ තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස:** අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**JM1-1 2025 (රු. 72,650 – 10x–1,360 – 18x 2,040 – 122,970/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## පර්යේෂණ නිලධාරී (තනතුරු 01) JM 1-1

**රැකියාවේ ස්වභාවය:** පර්යේෂණ නිලධාරියෙකු අදාළ තොරතුරු රැස් කිරීම සහ සංවිධානය කිරීම, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ මග පෙන්වීම යටතේ පර්යේෂණ කාර්යයන් පැවැත්වීම සහ පර්යේෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ආයතන සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීම මඟින් සංවිධානයේ පර්යේෂණ කටයුතු සඳහා සහාය විය යුතුය. මෙම භූමිකාවට දත්ත සහ ලියකියවිලි රැස් කිරීම, සංවිධානයේ අරමුණුවලට අදාළ වැදගත් ප්‍රවෘත්ති සහ මාධ්‍ය වාර්තා නිරීක්ෂණය කිරීම සහ සම්පාදනය කිරීම සහ පර්යේෂණ ආශ්‍රිත පැවරුම් සඳහා සහාය වීම ඇතුළත් වේ. මීට අමතරව, කළමනාකාරිත්වය විසින් පවරන ලද වෙනත් රාජකාරි ඉටු කිරීම නිලධාරියා වෙතින් අපේක්ෂා කෙරේ.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව පිළිබඳ උපාධියක්.

**වයස:**අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**JM1-1 2025 (රු. 72,650 – 10x–1,360 – 18x 2,040 – 122,970/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## සන්නිවේදන නිලධාරී (තනතුරු 02 ) JM 1-1

**රැකියාවේ ස්වභාවය:** සන්නිවේදන නිලධාරියෙකු සංවිධානයේ අරමුණු සහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සන්නිවේදන උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. මෙම භූමිකාවට ඩිජිටල්, සමාජීය සහ මුද්‍රිත මාධ්‍ය හරහා අන්තර්ගතය කළමනාකරණය කිරීම, මහජන දැනුවත්භාවය සහ සහභාගීත්වය වැඩි කිරීම සහ සංවිධානයේ නාමය සහ පණිවිඩකරණය සමඟ සියලු සන්නිවේදනයන් සමපාත වන බව සහතික කිරීම ඇතුළත් වේ. නිලධාරියා මාධ්‍ය සහ ප්‍රධාන කොටස්කරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම, ඉලක්කගත ප්‍රේක්ෂකයින් හඳුනාගෙන සම්බන්ධ කර ගැනීම, කාලරාමුව සහ අයවැය කළමනාකරණය කිරීමෙන් ඩිජිටල් ව්‍යාපෘති සඳහා සහාය වීම, අවශ්‍ය විට ක්ෂේත්‍ර කාර්යාල වෙත ගමන් කිරීම සහ කළමනාකරණය විසින් පවරන ලද අතිරේක රාජකාරි ඉටු කිරීම ඇතුළත් වේ.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය/ජනසන්නිවේදන පිළිබඳ උපාධියක්.

**වයස:**අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**JM1-1 2025 (රු. 72,650 – 10x–1,360 – 18x 2,040 – 122,970/-) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## භාෂා පරිවර්තක ( තනතුරු03 ) MA 1-1

**රැකියාවේ ස්වභාවය:**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතුවලට අදාළ සියලුම පරිවර්තන කටයුතු භාර ගැනීම සහ රාජ්‍ය භාෂා පනතට අනුකූලව කටයුතු කිරීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිවර්තන අධ්‍යයනය/ භාෂා (සිංහල /දෙමළ / ඉංග්‍රීසි) පිළිබඳ උපාධියක්

දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු විය යුතුය.

පහත සඳහන් කාණ්ඩවලට පරිවර්තනය කිරීමට විශිෂ්ට කුසලතා සහ කැමැත්ත ඔප්පු කර තිබිය යුතුය

- දෙමළ භාෂාව, සිංහල / ඉංග්‍රීසි භාෂාවට
- සිංහල / ඉංග්‍රීසි භාෂා, දෙමළ භාෂාවට

**වයස:**අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**MA 1-1 (46,220 – 10x–540 – 7x 630 – 4x 890 – 20x 1,190 – 83,390) (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

**ඉහත සියලුම පුරප්පාඩු සඳහා අදාළ වන කරුණු:**

- **සෑම අයදුම්කරුවෙක්ම:**
  - ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
  - ✓ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
  - ✓ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
  - ✓ යහපත් චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.
- පරිගණක සාක්ෂරතාවය සහ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මනා දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- අවශ්‍ය තොරතුරු **ඇතුළත් නොකර** ඉදිරිපත් කරනු ලබන ඕනෑම අයදුම්පතක් **ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- අයදුම් කරන තනතුර, අයදුම්පතේ සහ අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය.
- අයදුම්කරුවන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලබා දී ඇති අයදුම්පත් ආකෘතිය/ මාදිලි නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.
- තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
- කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.
- මෙම තනතුරු ස්ථිර වන අතර සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලබා දෙයි.
- බඳවා ගැනීම් සම්බන්ධ අවසන් තීරණය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල මණ්ඩලය සතු වන අතර, බඳවා ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඕනෑම තීරණයක් ගැනීමේ අයිතිය මණ්ඩලය සතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමඟ **2026 ජූනි** මස **28** වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය:

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය.**

**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**